# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2133/39 – 2019 ජූලි 24 වැනි බදාදා – 2019.07.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොරැල්ල උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බොරැල්ල(කොට්ඨාස අංක 33 බොරැල්ල උතුර කොළඹ මහනගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/THI/2017/415 හා 2018.07.20 දිනැති ලෙස දැක්වෙන ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 1– වරි. අංක 265 (කොටසක්) පෙළෙන්ගස්තුඩුව පාර – ප්‍රමාණය: හෙක්. 0.1020ක් පමණ**

උතුරට: පෙළෙන්ගස්තුඩුව පාර, පෙළෙන්ගස්තුඩුව පාරේ වරි. අංකය හා හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම, පෙළෙන්ගස්තුඩුව පාරේ වරි. අංක 249 දරන ඉඩම සහ පෙළෙන්ගස්තුඩුව පාරේ වරි. අංකය සොයාගත නොහැකි නාගරික සංවර්ධන අධිකාරිය හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: පෙළෙන්ගස්තුඩුව පාරේ වරි. අංක 249 දරන ඉඩම සහ පෙළෙන්ගස්තුඩුව පාරේ වරි. අංකය සොයාගත නොහැකි නාගරික සංවර්ධන අධිකාරිය හිමිකම් කියන ඉඩම; දකුණට: පෙළෙන්ගස්තුඩුව පාරේ වරි. අංකය සොයාගත නොහැකි නාගරික සංවර්ධන අධිකාරිය හිමිකම් කියන ඉඩම සහ සර්පන්ටයින් පාරේ වරි. අංක 10/8 සහ 10/9 දරන ඉඩම; බටහිරට: සර්පන්ටයින් පාරේ වරි. අංක 10/8 සහ 10/9 දරන ඉඩම සහ පෙළෙන්ගස්තුඩුව පාර.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය : 4-3/11/2016/යූඩීඒ/523.
2019 අප්‍රේල් මස 09 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 316


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*